සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** / தென் மாகாணக் கல்வித் திணைக்களம்

**DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE**

**අවසාන වාර පරීක්ෂණය - 2021 (2022 මාර්තු)**

| 9 ශ්‍රේණිය | ඉස්ලාම් ධර්මය | කාලය පැය 2 |
|---|---|---|

නම / විභාග අංකය ..........................................................................................................

I කොටස

*** සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

*** ඉතා සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) අල්ලාහ්ගේ අලංකාර නම් ගණන,
1) 99 2) 98 3) 97 4) 101

(02) 'ධර්මදූත මෙහෙවර' සඳහන් කරන පදය,
1) මආද්. 2) තව්හීද් 3) රිසාලත් 4) හිදායත්

(03) කියාමත් දිනය සම්බන්ධව,''හිසාබ්'' යනු
1) නැවත නැගිටුවීම 2) තටාකය 3) පාලම 4) ප්‍රශ්න කිරීම

(04) ස්වර්ගයේ ඉතා උසස්ම ස්ථානය වන්නේ
1) දාරුල් හුලුද් 2) ජන්නතුල් ෆිර්දව්ස් 3) දාරුස්සලාම් 4) ජන්නතුල් නඊම්

(05) අල්ලාහ්ගේ පූර්ණ අභිමත බලය හැඳින්වෙන අරාබි පදය
1) ඉල්ම් 2) ඉරාදත් 3) සිෆාත් 4) අද්ල්

(06) 'කලාකද්ර්' යනු
1) සාධාරණ නීතිය 2) ගුණාංග 3) පෙර මිනුම 4) දැනුම

(07) අනිවාර්ය ස්නානය සඳහා භාවිතා කරන ජලය
1) මාඋල් මුස්තඃමල් 2) මාඋත්තාහිර් 3) මාඋන් කලීල් 4) මාඋත් තහූර්

(08) ජම්උ, කස්රු කළ නොහැකි ෆර්ල් සලාතයකි.
1) සුබහ් 2) මඃරිබ් 3) අසර් 4) ඉෂා

(09) ස්ත්‍රීන් සඳහා කෆන් කිරීමට භාවිත කරන රෙදි ප්‍රමාණය වන්නේ,
1) තුනකි 2) පහකි 3) හතරකි 4) හයකි

(10) එළුවන් 110 ක් තිබෙන පුද්ගලයකු සකාත් වශයෙන් ලබා දිය යුතු ප්‍රමාණය,
1) එළු දෙනුන් 02කි. 2) එළු දෙනුන් 03කි. 3) එළුවන් 04කි. 4) එක් එළු දෙනෙකි.

(11) හජ් වගකීම අනිවාර්ය වූ හිජ්රි වර්ෂය,
1) හි. 6 2) හි. 7 3) හි. 9 4) හි. 11

(12) අල්කුර්ආනය නබි (සල්) තුමාට පහළ වූ සම්පූර්ණ කාල වකවානුව අවුරුදු,
1) 21කි. 2) 23කි. 3) 25කි. 4) 29කි.

(13) මුසා නබි තුමා උපත ලැබූ කාලවකවානුවේ පාලකයා වන්නේ,
1) ෆිර්අව්න් 2) නුම්රූද් 3) හාමාන් 4) දුල් කර්නෛන්

(14) නබි ඊසා (අලෛ) තුමාගේ මවගේ නම,
1) සාරාතුමිය 2) හාජර්තුමිය 3) මර්යම්තුමිය 4) බල්කීස්තුමිය

(15) 'උම්මුල් මසාකින්' නම් සුවිශේෂී නමින් හැඳින්වෙන නබි තුමාගේ බිරිඳකි.
1) කදීජා (රලි) 2) හෆ්සා (රලි)
3) සව්දා (රලි) 4) සෙයිනබ්බින්ත් කුසෙමා(රලි)

(16) සූරා ලුහාහි ඇතුළත් වූ ආයත් ගණන,
1) 11 කි. 2) 12 කි. 3) 13 කි. 4) 15 කි.

(17) සහිහ් බුහාරිහි අඩංගු වන හදිස් සංඛ්‍යාව.
1) 4000 2) 7575 3) 4800 4) 7275

(18) ඉමාම් නවවී (රහ්) තුමා මිය යනවිට වයස,
1) 30 කි. 2) 40 කි. 3) 50 කි. 4) 60 කි.

(19) මක්කාවට ඇතුළු වූ විට ඉටු කරන තවාෆය (තවාෆුල් කුදූම්)
1) ෆර්ල් වේ 2) වාජිබ් වේ 3) සුන්නත් වේ 4) මුබාහ් වේ

(20) නිරය වාසීන්ට ලබා දෙන ආහාර වර්ගයකි.
1) මන්නුස් සල්වා 2) සක්කූම් 3) හුබුස් 4) තආම්

(ලකුණු 2x20 = 40)

## II කොටස

*  පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

**(01) කෙටි පිළිතුරු ලියන්න.**

1) ස්වර්ගයේ නම් දෙකක් සඳහන් කරන්න.
2) අනිවාර්ය ස්නානයෙහි ෆර්ලයන් සඳහන් කරන්න.
3) කස්රු කර ඉටු කළ නොහැකි සලාතයන් දෙකක් නම් කරන්න.
4) ජනාසා සඳහා ඉටු කරන වගකීම් කුමක්ද?
5) සකාත් අනිවාර්ය වන පලතුරු වර්ග නම් කරන්න.
6) හජ් ඉටු කිරීමට නියියත් තබන ආකාර දෙකක් ලියන්න.
7) ශ්‍රී ලංකාවේ තිබෙන ප්‍රධාන ආගම් හතරක් නම් කරන්න.
8) ඉස්ලාමීය ඉතිහාසයේ කීර්තිමත් වීරවරුන් දෙදෙනෙකු නම් කරන්න.
9) උම්මහාතුල් මුඃමිනීන්වරු දෙදෙනෙකු නම් කරන්න.
10) අල්ලාහ් තහනම් (හරාම්) කළ කරුණු දෙකක් ලියන්න.

ලකුණු 2x10=20

(02) 1) තවාෆ්හි වර්ග දෙකක් නම් කරන්න.
2) හජ්හි අර්කානයන් (ෆර්ල්) තුනක් ලියන්න.
3) සකාත් ලැබීමට සුදුසු කණ්ඩායම් පහක් නම් කරන්න.

(ලකුණු 2+3+5 =10)

(03) 1) නිරයේ නම් හතරක් ලියන්න.
2) ජනාබත්වූ අය නොකළයුතු ක්‍රියාවන් තුනක් ලියන්න.
3) පව්සමාව අයැදීම සඳහා වූ කොන්දේසින් පහක් ලියන්න.

(ලකුණු 2+3+5 =10)

(04) 1) 'හජ්ජතුල් විදා' යනු කුමක්ද? එම සිද්ධිය සිදු වූ හිජ්රි වර්ෂයද සඳහන් කරන්න.
2) ජාතීන් අතර සහජීවනය ගොඩනැගීමට ඔබ ඉදිරිපත් කරන යෝජනාවන් තුනක් ලියන්න.
3) ප්‍රධාන හදීස් ග්‍රන්ථ හය සහ එම ග්‍රන්ථයේ ඉමාම්වරුන්ගේ නම් සමඟ ලියන්න.

(ලකුණු 2+3+5 =10)

(05) 1) මස්ජිදයට ඇතුළු වන විට උසුරන දුආව ලියන්න.
2) කාලය ප්‍රයෝජනව ගත කිරීමට අප කළයුතු ක්‍රියාවන් තුනක් ලියන්න.
3) සකාත් අනිවාර්ය වූ ද්‍රව්‍යයන් සඳහන් කරන්න.

(ලකුණු 2+3+5 =10)

(06) 1) අවසන් දිනය හැඳින්වන වෙනත් නම් දෙකක් ලියන්න.
2) ජුම්ආ දිනයේ අපි පිළිපැදිය යුතු යහපත් ක්‍රියාවන් තුනක් ලියන්න.
3) සකාත් වගකීම් නිසි ලෙස ඉටු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන පහක් ලියන්න.

(ලකුණු 2+3+5 =10)

(07) 1) ''යව්මුල් තර්විියා'' යනු කුමක්ද?
2) හජ් හා සම්බන්ධ ස්ථාන තුනක් නම් කරන්න.
3) නබි(සල්) තුමා කෙරෙහි ආදරය දක්වීම සඳහා ඉස්ලාම් පෙන්වා දී ඇති ක්‍රියාවන් පහක් ලියන්න.

(ලකුණු 2+3+5 =10)

9 ශ්‍රේණිය - ඉස්ලාම් ධර්මය
පිළිතුරු පත්‍රය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (01) | 1) 1 | 2) 3 | 3) 4 | 4) 2 | 5) 2 | 6) 3 |
| | 7) 4 | 8) 1 | 9) 2 | 10) 4 | 11) 3 | 12) 2 |
| | 13) 1 | 14) 3 | 15) 4 | 16) 1 | 17) 4 | 18) 2 |
| | 19) 3 | 20) 2 | | | (ලකුණු 2x20 = 40) | |

**II** කොටස

(01) 1) ජන්නතුල් ෆිර්දව්ස්, ජන්නතුල් අද්න්, දාරුස් සලාම්, ජන්නතුල් මඃවා...
2) ෆර්ල් වු ස්නානය සඳහා නියයත් තැබීම, මුළු ශරීරයම අති පිරිසිදු ජලයෙන් සෝදා ගැනීම.
3) සුබහ්, මඃරිබ්
4) නෑවීම, කෆන් කිරීම, සලාතය ඉටු කිරීම, මිහිදන් කිරීම (4ක් ලියා ඇත්නම් ලකුණු 2කි.)
5) රටඉඳි, මිදි
6) අල්ඉෆ්රාද්, අල්කිරාන්, අත්මත්උළ
7) බෞද්ධ, ඉස්ලාම්, ක්‍රිස්තියානි, හින්දු
8) සලාහුදීන්, අයයුබ්,සුල්තාන් මුහම්මද් අල්ෆාතිහ්
9) සෛනබ් බින්ත් හුසෛමා (රම්), සෛනබ් බින් ජහ්ෂ් (රළි), මයිමූනා (රළි)...
10) ආහාර හා සම්බන්ධ, ඇඳුම් හා සම්බන්ධ, ඉපැයීම හා සම්බන්ධ. (ලකුණු 2x10 = 10)

(02) 1) තවාෆුල් ඉෆාලා, තවාෆුල් කුදූම්, තවාෆුල් විදාඋ
2) නියයත් තැබීම, දුල්හජ් 9 අරෆාහි රැඳීම, තවාෆුල් ඉෆාලා කිරීම.
3) ෆකීර්, මිස්කීන්, ආමිල්, මුඅල්ලෆතුල් කුලුබ්, රිකාබ්, ෆිසබිලිල්ලාහ්... (ලකුණු 2+3+5 =10)

(03) 1) නාර්, සඊර්, ජහීම්, සකර්, හාවියා, හුතමා (4 ක් ලියා ඇත්නම් ල.2)
2) සලාතය ඉටු කිරීම, ඉඃතිකාෆ් සිටීම, තඩාෆ් කිරීම.

3. 1) තමා කළ පාපයන් ගැන පසුතැවිලි වීම.
2) පිරිසිදු චේතනාවෙන් පව්සමාව අයැදීම
3) එම පාපය නැවත නොකරන බවට අධිෂ්ඨාන කිරීම
4) තමා කළ පාපය සම්පූර්ණයෙන් අතහැර එයින් මිදීම.
5) තවත් පුද්ගලයකු සම්බන්ධ වන්නේ නම් ප්‍රථමයෙන් ඔවුන්ගෙන් සමාව ගැනීම.
(ලකුණු 2+3+5 =10)

(4) 1) සමු ගැනීමේ හජ්, හිජ්රි - 10
2) පොදු සිදුවීම් - උත්සව අවස්ථාවල සහභාගි වීම.
සෙසු ආගමිකයන්ගේ සංස්කෘතින් ඉගෙන ගැනීම
ජාතික සුහදතාව ඇති කිරීමට රැස්වීම්, වැඩසටහන් සංවිධානය කිරීම.
එකිනෙකාට උදව් උපකාර කිරීම.
3) ඉමාම් බුහාරි - සහීහුල් බුහාරි
ඉමාම් තිර්මිදි - ජාමිඋත් තිර්මිදි
ඉමාම් අබුදාවුද් - සුනන් අබුදාවුද්
ඉමාම් අන්නසාර් - සුනන් නසාඊ
ඉමාම් ඉබ්නුමාජාහ් - සුනන් ඉබ්නුමාජාහ් (ලකුණු 2+3+5 =10)
ඉමාම් මුස්ලිම් - සහීහ මුස්ලිම්

(7) 1) දුල්හජ් අටවන දින
2) කඃබතුල්ලාහ්, මිනා, අරෆා, ජම්රා තුන, සෆා, මර්වා, මුස්තලිෆා
3) * නබි (සල්) තුමා කෙරෙහි අධික සලවාත් පැවසීම
* සහාබාවරුන් වෙත ආදරය දැක්වීම
* නබි (සල්) තුමාගේ සුන්නාන්ව අනුගමනය කිරීම
* නබි තුමාගේ සීරාව අධ්‍යයනය කිරීම.
* අහ්ලුල් බෛත්වරුන් කෙරෙහි ස්නේහය දැක්වීම. (ලකුණු 2+2+3+4 =11)